# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,861 - 2014 මැයි මස 02 වැනි සිකුරාදා - 2014.05.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 330 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 23 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

329– B 080834—300 (2014/04)

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 1302400.
විජේසිංහගේ නිරෝෂන් ක්‍රිෂාන්ත ෆොන්සේකා
බර්නඩෙත් නිලන්ති ඩයස් කරුණාරත්න

2014 පෙබරවාරි 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. ගමගේ විසින් 2012 අගෝස්තු 14 වැනි දින සහතික කරන ලද අංක 4525 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී නමට ලියන ලද්දා වූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම විජේසිංහගේ නිරෝෂන් ක්‍රිෂාන්ත ෆෝන්සේකා සහ බර්නඩෙත් නිලන්ති ඩයස් කරුණාරත්න ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්කෝටි විසිඅටලක්ෂ හැටදෙදහස් තිස්දෙකක (රු.12,862,032) ක මුදලක් 2014 ජනවාරි 10 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයික් එකී රුපියල් එක්කෝටි විසිඅටලක්ෂ හැටදෙදහස් තිස්දෙකක (රු.12,862,032) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2014 ජනවාරි 11 වැනි දින සිට විකිණීමේ දින දක්වා කාලයට රු. 11,818,933 ක මුදල මත 15.5% වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ද ඇතුලුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 4525 දරන බැඳුම්කරය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ෆ්ඩෝප් වීදියේ අංක 182 හි තුන්වන මහලේ ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන්හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභා සීමාවේ 522D පිටකෝට්ටේ ග්‍රාම නිළධාරි වසමේ පිටකෝට්ටේ සුහසාධක මාවතේ වරිපනම් අංක 38/7 දරන අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ටී. අබේසිංහ විසින් 2009 නොවැම්බර් 01 දින සාදන ලද අංක 1701 දරන පිඹුරේ සඳහන් ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : අඩි 10 ක් පළල පාර (පිඹුරු අංක 3715 හි ලොට් 1E) සහ එන්. ටී. බෝගහලන්දගේ ඉඩම ද, නැගෙනහිරට : මිනුම්පතිගේ පිඹුරු අංක PP CO 5425 හි ලොට් 5 ද, දකුණට : කේ. විජේසේකර සහ තවත් අයට අයිති ඉඩම ද සහ බස්නාහිරට : පිඹුරු අංක 1701 ට අනුව ඩී. රත්නපාල සහ එල්. එස්. ද සිල්වා ට අයිති ඉඩමෙන් ද පිඹුරු අංක 1701 අනුව පර්චස් විසිතුනයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 23.5) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් සමග වේ.

ඉහත සඳහන් ඉඩම පහත විස්තර සඳහන් ඉඩමේ නැවත මැනීමක් වේ.

ඉහත සඳහන් පිටකෝට්ටේ පිහිටි අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් 1986 අප්‍රේල් 08 වැනි දින සාදන ලද අංක 3715 දරන පිඹුරේ සඳහන් ලොට් 1C වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : ලොට් 1E සහ ලොට් 1B ද, නැගෙනහිරටඃ මිනුම්පතිගේ පිඹුරු අංක 5425 හි ලොට් 5 ද, දකුණට : පිඹුරු අංක 227 හි ලොට් 4 ද සහ බස්නාහිරට : ලොට් 1D පිඹුරු අංක 3715 ට අනුව පර්චස් විසිතුනයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 23.5) ක වන මෙය නුගේගොඩ-දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව M2118/47 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත විස්තර සඳහන් මාර්ග වෙන්කිරීම මතුපිටින් මඟදිගේ හා ඒ තුළ ගමන් කිරීමේ ඇති අයිතියද සමඟ වේ.

ඉහත සඳහන් පිටකෝට්ටේ පිහිටි අඹගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් 1986 අප්‍රේල් 08 දින සාදන ලද අංක 3715 දරන පිඹුරේ සඳහන් ලොට් 1E (අඩි 10 ක් පළල පාරක් සඳහා වෙන් කිරීමක්) වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරටඃ ලොට් 1A සහ ලොට් 1B ද, නැගෙනහිරට : ලොට් 1B සහ ලොට් 1C ද, දකුණටඃ ලොට් 1C සහ ලොට් 1D සහ බස්නාහිරට : පාරෙන් ද මායිම් වූ පිඹුරු අංක 3715 ට අනුව පර්චස් තුනයි දශම හතයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 3.70) ක් වන මෙය නුගේගොඩ - දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව M886/291 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

05-10

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය.

ණය ගිණුම් අංකය : 684155.
වී ගෲප් හොස්පිට්ල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්.

2014 මාර්තු මස 28 වැනි දින පැවැත්වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

යාපනය ප්‍රසිද්ධ නොතාරිස් වි. ටී. සිවලිංගම් විසින් සහතික කරන ලද 2010.10.27 වන දින අංක 1356 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්, දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමින් වූ බැඳුම්කරය යටතේ යාපනය සී. පොන්නම්බලම් පාර අංක 195 ස්ථානයේ සිට ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා නීතිය යටතේ සංස්ථාගත කර ඇති සමාගමක් වන වී. ගෲප් හොස්පිට්ල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් බන්ධනදායී වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව

ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දෙකෝටි පනස් හය ලක්ෂ හැට අට දාස් පන්සිය අනූ හතරයි ශත හැත්තෑ පහක් (රු. 25,668,594.75) ක මුදලක් 2014.03.07 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් දෙකෝටි පනස් හය ලක්ෂ හැට අට දාස් පන්සිය අනූ හතරයි ශත හැත්තෑ පහක් (රු.25,668,594.75) ක මුදල හා 2014.03.08 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 23,150,000 ක මුදලක් සඳහා වාර්ෂිකව 11.87% (PLR+1%) බැගින් වූ පොළිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවා ද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අය කර ගැනීම සඳහා එකී අංක 1356 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපල හා පරිශ්‍රය මහනුවර, මාවිල්මඩ, ලේවැල්ල පාර, දුටුගැමුණු මාවතේ, අංක 369/1 හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

### උපලේඛනය

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ වන්නපූනායි පැරිෂ් පළාත් පාලන කොට්ඨාසයේ ගිණිකොණ වන්නපූනායි හි පිහිටි තාන්ඩිකුලම්කරෙයියුම්, උප්පුකුලම් කරෙයිවායලුම්, තාඩිකුලම් කරෙයි ඉනුටුවාන් වයල් වරම්බුම් සහ අනෙකුත් ඉඩම් කොටසට බලයලත් මානක තලම්තිකරු එම්. නවරත්නම් විසින් 1983.07.10 වන දින සාදන ලද අංක 337 බී දරන පිඹුරේ නිරූපිත ලොට් 2 නැමැති ඉඩම් කොටසට මායිම් එනම්, නැගෙනහිරට : 3 වන පටුමගෙන් ද, උතුරට : ඉහත කී පිඹුරේ නිරූපිත ලොට් 1 න් ද බස්නාහිරට : වර්තරාජා ශ්‍රීරංගන් යන අයගේ දේපළින් ද සහ දකුණට : වර්තරාජා යන අයගේ දූවරුන් වන ලීලාවති, සරෝජිනි සහ සාත්තියාමා යන අයගේ දේපලින් ද යන මෙකී මායිම් තුළ පිහිටි 4Lms P.C සහ 5.78 Kls විශාල ඉඩම. මෙය යාපනය ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්ඉරුව D513/208 හි ලියාපදිංචි කර ඇත.

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ වර්නපූනායි පැරීෂ් පළාත් පාලන කොට්ඨාසයේ වර්නපූනායි ගිණිකොන පිහිටි තාන්ඩිකුලම්කරෙයි, උප්පුකුලම්, කරෙයිවායල්, තාන්ඩිකුලම්කරෙයි ඉනුටුවාන්වායල් වරම්පු, කඩෙයියාඩිතිඩල්, ඉනුටුවාන්තලෙයිමඩෙයි, ඉනුටුවාන්පාතේ වරම්පුපාතේ ඉනුටුවාන්, නමැති ඉඩමට බලයලත් මානක හා තලම්තිකරු එම් නවරත්නම් විසින් 1979.12.31 වැනි දින අංක 337 බී නැමති පිඹුරේ නිරූපිත ලොට් 7 නැමැති ඉඩම් කොටසට මායිම් එනම් නැගෙනහිරට : ඉහත කී පිඹුරු අංක 337හි නිරූපිත ලොට් 1 සිට 7 දක්වා ඇති ඉඩම් සඳහා පොදු මාර්ගය සඳහා වෙන් කර ඇති ඉහත කී පිඹුරේ ලොට් 4 න් සහ සී. පොන්නම්බලම් පටුමගෙන් ද (3 වන පටුමග) උතුරට : වර්තරාජා සරෝජිනී යන අයට අයත් ඉහත කී පිඹුරේ ලොට් 6 න් ද, බස්නාහිරට : වර්තරාජා සරෝජිනී යන අයට අයත් ඉහත කී පිඹුරේ නිරූපිත ලොට් 6 න් ද සහ සී. පොන්නම්බලම් පාරෙන් ද සහ දකුණට : සී. පොන්නම්බලම් පාර සහ විදුලි බලාගාර පටුමග (Power House Lane) (3 වන පටුමග) යන මෙකී මායිම් තුළ පිහිටි ළිඳ සහ අනෙකුත් උපයාංගයන්, අයිතීන් ද සමග ඉඩමේ ප්‍රමාණය 1Lms P. C. සහ 4.55KLs. විශාල ඉඩම. මෙය යාපනය ඉඩම් කාර්යාලයේ වෙළුම/පත් ඉරුව D655/10 හි ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩම් කොටස් දෙක ඒකාබද්ධ කොට ලොට් 2 ක් ලෙසට 2010.08.14 වැනි දින සාදන ලද අංක 153ඒ/2010 දරන පිඹුරේ නිරූපිත ලොට් 1 ප්‍රමාණය 4Lms, P. C. සහ 06.01KLs සහ ලොට් 2 ප්‍රමාණය 1Lms, P. C. සහ 03.42KLs කොටස් දෙකෙයි මුළු ප්‍රමාණය වන 5Lms, P. C. සහ 09.43KLs නමැති ඉඩම් කොටසට මායිම් එනම්, නැගෙනහිරට සී. පොන්නම්බලම් පටුමගෙන් ද (3 වන පටුමග) උතුරට : සෙල්ලකන්ඩු යන අයගේ දේපලෙන් ද, බස්නාහිරට : වර්තරාජා ශ්‍රී රංගන් යන අයගේ දේපලෙන් ද සහ දකුණට : වර්තරාජා යන අයගේ දූවරුන් වන ලීලාවතී සහ සරෝජිනි යන අයගේ දේපලින් සහ සී. පොන්නම්බලම් පාර (විදුලි බලාගාර පාර) යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී පරිදි 5Lms P.C. සහ 09.43KLs ප්‍රමාණයෙන් යුතු ඉඩම හා එයට අයත් සියළු දේ.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

05-17

---

### යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී.

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීමයි

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී (මෙහි මින් මතු යූනියන් බැංකුව වශයෙන් හඳුන්වනු ලබන), අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 මාර්තු මස 03 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මඩකලපුව, කළුවංචිකුඩි 9, ශක්ති ඉල්ල වීදියේ, පදිංචි වර්ධරාජා රෝහිණී යන අය (මෙහි මින් මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන,) විසින් යූනියන් බැංකුව වෙතින් බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී උකස්කරු, මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වී. කනගරත්නම් විසින් සහතික කරන ලද අංක 5091 සහ 2011.09.21 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට, එකී ණය පහසුකම් නිසා යූනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් මිලියන පහක (රුපියල් 5,000,000) සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත කී ණය පහසුකම නිසා 2013.11.30 වැනි දිනට රුපියල් හැටතුන්ලක්ෂ දහසයදහස් අටසිය හයකුත් ශත හතළිස් පහක (රුපියල් 6,316,806.45) මුදලක් සහ 2013.12.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට 24% බැගින් පොළියක් එකී යූනියන් බැංකුව වෙත ලැබිය යුතුය සහ අයවිය යුතුව තිබෙන බැවින් ද,

ඉහත කී ණය ශේෂය ගෙවා පියවා දැමීම ඉහත කී උකස්කරු විසින් පැහැර හැරීම සිදුකර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසු, යූනියන් බැංකුව විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, රුපියල් හැටතුන්ලක්ෂ දහසයදහස් අටසිය හයකුත් ශත හතලිස් පහක (රුපියල් 6,316,806.45) මුදල සහ 2013.12.01 වැනි දින සිට ඒ මත වර්ෂයකට 24% බැගින් පොළිය ද, තව ද ඉහත කී අංක 5091 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වී. කනගරත්නම් විසින් සහතික කරන ලද ඉහත කී අංක 5091 සහ 2011.09.21 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, ඉහත කී 1990 අංක 04 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරු ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්

වෙත බලය පැවරීමට 1990 අංක 04 දරන එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරුවිල්පත්තුවේ, කළුවංචිකුඩි ගමෙහි පිහිටි "ඊස්ටන් සීටන් එස්ටේට්/ගෘෆ්" නමැති බෙදා වෙන් කළ ඉඩමට මායිම් උතුරට : ශක්ති නිවාස පරිශ්‍රය ද, නැගෙනහිරට : වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පරිශ්‍රය ද, දකුණට : අඩි පාර ද, බස්නාහිරට : ශක්ති නිවාස අඩි පාර ද, යන මායිම් තුළ පිහිටි අක්කර එකක් (අ. 01, රූ. 0, පර්. 0) විශාල ඉඩම සහ ඒ මත පිහිටි සෑම සියලු දේත් සමග ය. මෙම ඉඩම අංක H152/208 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම, බලයලත් මිනින්දෝරු වී. රාජේන්ද්‍රන් විසින් ඇඳ සාදන ලද අංක R/010/2011 සහ 2011.01.03 දිනැති මානක පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ එරුවිල්පත්තුවේ මන්මුනායි දකුණු එරුවිල්පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මන්මුනායි දකුණු එරුවිල්පත්තු ප්‍රාදේශීය සභා සීමාව තුළ කළුවන්චිකුඩි ගමේ පිහිටි ඊස්ටන් සීටන් නමැති බෙදා වෙන් කළ ඉඩමට බලයලත් මිනින්දෝරු වී. රාජේන්ද්‍රන් විසින් ඇඳ සාදන ලද අංක R/010/2011 සහ 2011.01.03 දිනැති පිඹුර ප්‍රකාර මායිම් උතුරට : ඉහළ අදිපරශක්ති කෝවිල දක්වා වැටී ඇති මීටර් 3.60 ක් පළල වර්තමාන අඩි පාර ද, නැගෙනහිරට : වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පරිශ්‍රය ද, දකුණට : ප්‍රධාන පාර දක්වා වැටී ඇති පාර ද, බස්නාහිරට : ශක්ති ඉල්ලම් පාර ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර 0.4047 හෙවත් අක්කර එකක් (අ. 01, රූ. 0, පර්. 0) විශාල ඉඩම, ගොඩනැගිලි, ළිඳ ඇතුළු ඊට අයිති සෑම සියලු දේත් සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-46

---

## යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යුනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු යුනියන් බැංකුව වශයෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004 මාර්තු මස 03 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ඔරුවල, විද්‍යාල මාවත, අංක 58 දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන සවුත් ඒසියා ට්‍රේඩින් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (මෙහි මින් මතු බන්ධනදායී වශයෙන් හඳුන්වනු ලබන), විසින් පිළිවෙලින් අංක 01 දරන ණය පහසුකම යටතේ රුපියල් මිලියන හයක (රු.6,000,000) පිළියෙදුම් ලේඛන ණය (දුටුවන) පහසුකමක් ද, අංක 02 දරන ණය පහසුකම යටතේ රුපියල් මිලියන හයක (රු. 6,000,000) පිළියෙදුම් ආයාත ණය පහසුකමක් ද, (අංක 01 දරන ණය පහසුකම යටතේ උප සීමාව) සහ එමෙන්ම අංක 03 දරන ණය පහසුකම යටතේ රුපියල් මිලියන දෙකක (රු. 2,000,000) පිළියෙදුම් කෙටි කාලීන ණය පහසුකමක් ද, ලබා ගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී විසින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්. රාජකරුණා විසින් සහතික කරන ලද අංක 28827 සහ 2013.03.27 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට, එකී මූල්‍ය ණය පහසුකම් නිසා යුනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් මිලියන අටක (රු. 8,000,000) මුදල ආපසු ගෙවීම සඳහා ඇපකරයක් වශයෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස්කොට ඇපයට තබා ඇති බැවින් ද, එකී මූල්‍ය ණය පහසුකම් මත 2013.11.30 වන දිනට හිඟ මුදල වන රුපියල් හැටපන්ලක්ෂ හැටහතරදහස් පනස්එකයි ශත හැටහයක (රුපියල් 6,564,051.66) මුදලක් සහ 2013.12.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත එකී මූල්‍ය ණය පහසුකම් නිසා එකී බන්ධනදායී වෙතින් යුනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී මූල්‍ය ණය ශේෂය හෝ ඉන් කොටසක් ගෙවා පියවා දැමීම ඉහත කී උකස්කරු විසින් පැහැර හැරීම සිදුකර ඇති බවට යුනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, යුනියන් බැංකුව විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, එකී මූල්‍ය ණය පහසුකම් මත රුපියල් හැටපන්ලක්ෂ හැටහතරදහස් පනස්එකයි ශත හැටහයක (රු. 6,564,051.66) මුදලක් සහ 2013.11.30 වැනි දින සිට ඒ මත පොලිය ද, තව ද ඉහත කී අංක 28827 දරන උකස් බැඳුම්කර සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව යුනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළුම මුදල් ප්‍රමාණයන් ද අයකර ගැනීම සඳහා ඉහත කී අංක 28827 දරන උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යුනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, ඉහත කී 1990 අංක 04 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරු ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක 04 දරන එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ මහරගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අංක 524 දරන මාදිවෙල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි, ග්‍රාම සංවර්ධන පාරේ වරිපනම් අංක 48 දරන, පැලැන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඒ. ජයරත්න විසින් මැන සාදන ලද අංක 4261A සහ 2003.08.17 දින දරන පිඹුර ප්‍රකාර වෙන් කළ කැබලි අංක 4B දරන බිම් කොටසට මායිම් උතුරට : කැබලි අංක 06 ද, නැගෙනහිරට : ග්‍රාම සංවර්ධන පාර (ධර්මරත්න පාර) ද, දකුණට : කැබලි අංක 05 ද, බස්නාහිරට : කැබලි අංක 4A ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහයක් (අ. 0, රූ. 0, පර්. 26.0) හෙවත් හෙක්ටයාර 0.9658 ක් විශාල ඉඩම් කැබැල්ල සහ ඊට අයිති ගොඩනැගිලි ගහකොළ පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1/23 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමට පහත සවිස්තරව දක්වා ඇති ඉඩම්වලින් ගමන් කිරීමේ මාර්ග අයිතිය ද සමගය.

2. ඉහත කී මාදිවෙල පිහිටි පැලැන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. සී. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 1314 සහ 1972.03.21 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 06 දරන

බිම් කොටසට මායිම් උතුරට : අංක 2274 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 22 ද, නැගෙනහිරට : අංක 2274 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 24 (පාර) ද, දකුණට : එකී අංක 1314 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 2, 3 සහ 4 ද, බස්නාහිරට : එකී අංක 1314 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම දෙකක් (අ. 0, රූ. 0, පර්. 13.2) ක් විශාල බිම් කැබැල්ල ය. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1/24 යටතේ ලියාපදිංචි කර ඇත.

3. ඉහත කී මාදිවෙල පිහිටි පැලැන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. මැලෝනි විසින් මැන සාදන ලද අංක 2274 සහ 1951.11.18 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 06 දරන බිම් කොටසට මායිම් උතුරට : ප්‍රධාන පාරේ සිට වැටී ඇති පුද්ගලික පාර සහ බලයලත් මිනින්දෝරු ජේම්ස් රුද්‍රිගු විසින් මැන සාදන ලද අංක 2900 සහ 1936.05.07 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 1 ද, නැගෙනහිරට : ඩී. ඩී. මාටින් පෙරේරාගේ උරුමක්කාරයන් විසින් හිමිකම් කියන ඉඩම, අංක 3/L දරන දිසා අධිකරණ නඩුවට බලයලත් මිනින්දෝරු ජේම්ස් රුද්‍රිගු විසින් මැන සාදන ලද අංක 2900 සහ 1936.05.07 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක J, අංක 1942/P දරන දිසා අධිකරණ නඩුවට බලයලත් මිනින්දෝරු දොන් ඩේවිඩ් විසින් මැන සාදන ලද අංක 4144 සහ 1947.11.20 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 8 සහ කැබැලි අංක 8 ද, දකුණට : කැබලි අංක 8 ද, බස්නාහිරට : කැබලි අංක 36,35, 34, 33, 32, 31, 30, 29, 28, 27, 26, 25 සහ කැබලි අංක 22 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතක් (අ. 0, රූ. 0, පර්. 27) විශාල බිම් කැබැල්ල ය. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1/25 යටතේ ලියාපදිංචි කර ඇත.

4. ඉහත කී මාදිවෙල පිහිටි පැලැන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 2503 සහ 1999.02.13 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 22C (කැබැලි අංක 22D සහ කැබලි අංක 22F සහිතව අඩි 20 ක් පළල පාරකට අඩි 10 ක් පළල පාර වෙන් කිරීම ද,) දරන බිම් කොටසට මායිම් උතුරට : අංක 2503 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 22B සහ 22A ද, නැගෙනහිරට : දැනට වැටී ඇති පාර ද, දකුණට : අංක 2503 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 22D ද, (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම ද) ද, බස්නාහිරට : අංක 2503 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 22D ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහක් (අ. 0, රූ. 0, පර්. 12) ක් විශාල බිම් කැබැල්ල ය. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1/26 යටතේ ලියාපදිංචි කර ඇත.

5. ඉහත කී මාදිවෙල පිහිටි පැලැන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද අංක 2503 සහ 1999.02.13 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 22D (හැරවුම් වටරවුමේ කොටසක්) දරන බිම් කොටසට මායිම් උතුරට : කැබලි අංක 22 හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : එකී අංක 2503 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 22C ද, දකුණට : එකී අංක 2503 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 22F ද, බස්නාහිරට : කැබලි අංක 22 හි ඉතිරි කොටස ද, යන මායිම් තුළ පිහිටි පර්චස් එකයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 1.25) ක් විශාල බිම් කැබැල්ල ය. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A1/27 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-47

## යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී. විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින් මතු යූනියන් බැංකුව වශයෙන් හඳුන්වනු ලබන,) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 මාර්තු මස 03 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මඩකලපුව, ගෝවින්ටන් පාරේ, අංක 27A දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන, ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත ප්‍රකාරව අංක DS/MN/C/BR/992 යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද, බෙනාල් කන්ස්ට්‍රක්ෂන් යන නාමය විලාසය සහ අභිධානය යටතේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන බෙන්ජමින් ජයකුලේන්ද්‍රන් යන අය (මෙහි මින්මතු බන්ධනදායී වශයෙන් හඳුන්වනු ලබන,) සිය ජංගම ගිණුම මත අයිරාවක්, කාර්යසාධන ඇපකරයක් සහ කල්බදු පහසුකමක් ආකාරයෙන් කලින් කලට බැංකු පහසුකම් ලබාගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් වේදවානම් කනගරත්නම් විසින් රුපියල් මිලියන අටක් (රු. 8,000,000) සඳහා සහතික කරන ලද අංක 5022 සහ 2011.08.29 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය සහ රුපියල් මිලියන පහක් (රු. 5,000,000) සඳහා සහතික කරන ලද අංක 5136 සහ 2011.10.05 දිනැති ද්විතීයික උකස් බැඳුම්කරය ලියා අත්සන් කොට, ඉහත කී අයිරා පහසුකම සහ කාර්යසාධන ඇපකර පහසුකම නිසා යූනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් එක්කෝටි විසිහත් ලක්ෂ හැටඅටදහස් දෙසිය හැත්තෑ තුනකුත් ශත හතළිහක (රු. 12,768,273.40) මුදල සහ ඒ මත පොළිය ආපසු ගෙවීම සඳහා ඇපකරයක් වශයෙන් එකී බන්ධනදායී විසින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ උකස්කොට ඇපයට තබා ඇති බැවින් ද, එකී අයිරා පහසුකම නිසා 2013.09.31 වැනි දිනට හිඟ මුදල වන රුපියල් අනූතුන්ලක්ෂ අනූහත්දහස් හාරසිය හැටතුනකුත් ශත විසිහතක (රු. 9,397,463.27) මුදල සහ 2013.10.01 දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත වර්ෂයකට 24% බැගින් පොලිය සෘජු බැරකමක් වශයෙන් එකී බන්ධනදායී වෙතින් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව තිබෙන බැවින් ද,

ඉහත කී ණය ශේෂය ගෙවා පියවා දැමීම ඉහත කී උකස්කරු විසින් පැහැර හැරීම සිදුකර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, යූනියන් බැංකුව විසින් 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත කී අයිරා පහසුකම මත 2013.09.30 වැනි දිනට සෘජු බැරකමක් වශයෙන් රුපියල් අනූතුන්ලක්ෂ අනූහත්දහස් හාරසිය හැටතුනකුත් ශත විසිහතක (රු. 9,397,463.27) මුදල සහ 2013.10.01 වැනි දින සිට ඒ මත වර්ෂයකට 24% බැගින් පොළිය ද, තව ද ඉහත කී අංක 5022 සහ 5036 දරන උකස් බැඳුම්කර සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියළු ම මුදල් ප්‍රමාණයන් ද, අයකර ගැනීම සඳහා ඉහත කී අංක 5022 සහ 5036 දරන උකස් බැඳුම්කරවල බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ, ඉහත කී 1990 අංක 04 දරන පනත ප්‍රකාරව වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරු ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් වෙත බලය පැවරීමට 1990 අංක

04 දරන එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළෙයි පත්තුවේ පාසිකුඩා ගමේ පිහිටි කරුන්කලිච්චෝලෙයි ඉඩමේ කොටසක බස්නාහිර පංගුවට මායිම් උතුරට : අරුණාසලම් අදිතකුමාර්ගේ ඉඩම ද, නැගෙනහිරට : ඇළ ද, දකුණට : කුමාරස්වාමි ඉලෙයතම්බි යන අයගේ ඉඩම ද, බස්නාහිරට : පාර ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකක් (අ. 0, රූ. 02, පර්. 0) විශාල ඉඩම් කොටස සහ ඊට අයිති සෑම සියලු දේත් සමඟ ය. මෙම ඉඩම අංක G258/55 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම, බලයලත් මිනින්දෝරු ටී. එලවරසු විසින් ඇඳ සාදන ලද අංක E/155/2011 සහ 2011.07.15 දිනැති මානක පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

නැගෙනහිර පළාතේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරලෙයිපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කෝරලෙයිපත්තු ප්‍රාදේශීය සභා සීමාව තුළ පාසිකුඩා ගමේ පාසිකුඩා පාරේ පිහිටි කරුන්කලිච්චේනෙයි ඉඩමේ කොටසකට බලයලත් මිනින්දෝරු ටී. එලවරසු විසින් ඇඳ සාදන ලද අංක E/155/2011 සහ 2011.07.15 දිනැති මානක ප්‍රකාර මායිම් උතුරට : අරුණසලම් අදිතකුමාර් යන අයගේ ඉඩම ද, නැගෙනහිරට : ඇළ ද, දකුණට : කුමාරස්වාමි එලයතම්බි යන අයගේ ඉඩම ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර 0.202343 හෙවත් රූඩ් දෙකක් (අ. 0, රූ. 02, පර්. 0) විශාල ඉඩම සහ ඊට අයිති සෑම සියලු දේත් සමඟ ය.

උකසට තබන ලද දේපළෙහි හිමිකම පැවරීම වනාහි ප්‍රසිද්ධ නොතාරිස් ඒ. මහාලිංගසිවම් විසින් සහතික කරන ලද අංක 1338 සහ 2011.07.25 දිනැති විකුණුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

05-48

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංක පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 1137843
යූ. සී. අයි. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්

2014 පෙබරවාරි මස 28 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එන්. පී. හීන්කෙන්ද විසින් 2012 මාර්තු මස 05 වැනි දින සහතික කරනල ද අංක 122 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ ද බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නුගේගොඩ ගංගොඩවිල රබර්වත්ත පාරේ අංක 28/5 ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය පිහිටි ශ්‍රී ලංකාවේ නිත්‍යානුකූලව ස්ථාපිත සමාගමක් වූ යූ. සී. අයි. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූඑක්ලක්ෂ අටදහස් හත්සිය විස්සක (රු. 9,108,720) මුදලක් 2014 ජනවාරි මස 01 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී අනූඑක් ලක්ෂ අටදහස් හත්සිය විස්සක (රු. 9,108,720) මුදල අයකර ගැනීම සඳහා සහ 2014 ජනවාරි මස 02 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,972,000 ක මුදල මත 15% වැඩිදුර වාර්ෂික පොලිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ද ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩු කොට එකී අංක 122 දරන බැඳුම්කරය මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තාවූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩෝෆ් වීදියේ අංක 182 හි 3 වැනි මහලේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන්හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවේ ගංගොඩවිල පිහිටි රබර්වත්ත පාරේ වරිපනම් අංක 28/5 දරන ලන්සියාදෙණිය හෙවත් පින්හේන්දෙණිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. කන්නන්ගර විසින් 2011 දෙසැම්බර් මස 05 සහ 06 වැනි දින සාදන ලද අංක 2011/45 හි ලොට් 10 වශයෙන් දක්වා ඇති (බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ විසින් 1999 මැයි මස 25 වැනි දින සාදන ලද පිඹුරු අංක 4849A හි ලොට් 10 හි නැවත මැනීමකි) ඉඩමට මායිම් වශයෙන් උතුරට : පිඹුරු අංක 396 හි ලොට් 5 (පාර) ද නැගෙනහිරට : පිඹුරු අංක 396 හි ලොට් 9 ද, දකුණට : මංචනායකට අයත් කුඹුරුයාය ද සහ බස්නාහිරට පිඹුරු අංක 396 හි ලොට් 11 සහ නිවසේ ප්‍රවේශ මාර්ගයට මායිම් වූ එකී අංක 2011/45 දරන පිඹුරු ප්‍රකාරව පර්චස් විස්සක (අ. 0 රූ. 0 පර්. 20) ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් සමග වේ.

පිඹුරු අංක 2011/45 හි ලොට් 10 වශයෙන් දැක්වෙන මෙම ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ විසින් නැවත මැන සාදන ලද පිඹුරු අංක 4849A හි දැක්වෙන ලොට් 10 පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවේ ගංගොඩවිල පිහිටි රබර්වත්ත පාරේ වරිපනම් අංක 28/5 දරන ලන්සියාදෙණිය හෙවත් පින්හේන්දෙණිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඩී. ජී. වීරසිංහ විසින් 1999 මැයි 25 වැනි දින සාදන ලද පිඹුරු අංක 4849A හි ලොට් 10 වශයෙන් දැක්වෙන (බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. කන්නන්ගර විසින් 1994 ජූනි 08 වැනි දින සාදන ලද පිඹුරු අංක 354 හි දැක්වෙන ලොට් 10 හි නැවත මැනීමකි) ඉඩමට මායිම් වශයෙන් උතුරට : පාර ද, නැගෙනහිරට පිඹුරු අංක 396 හි ලොට් 9 ද, දකුණට : මංචනායකට අයත් වගුරු බිම ද සහ බස්නාහිරට : පිඹුරු අංක 396 හි ලොට් 11 සහ රබර්වත්ත පාරට වැටෙන පාරෙන් මායිම් වූ එකී අංක 4849A දරන පිඹුරු ප්‍රකාරව පර්චස් විස්සක (අ. 0 රූ. 0 පර්. 20) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය නුගේගොඩ-දෙල්කඳ ඉඩම්

ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු A6/173 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් පිඹුරු අංක 4849A හි ලොට් 10 වශයෙන් දැක්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. කන්නන්ගර විසින් නැවත මැන සාදන ලද පිඹුරු අංක 354A හි දැක්වෙන ලොට් 10 වශයෙන් දැක්වෙන ඉඩම පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවේ ගංගොඩවිල පිහිටි රබර්වත්ත පාරේ වරිපනම් අංක 28/5 දරන ලන්සියාදෙණිය හෙවත් පින්හේන්දෙණිය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඩී. පී. කන්නන්ගර විසින් 1994 ජුනි 08 වැනි දින සාදන ලද පිඹුරු අංක 354 හි ලොට් 10 වශයෙන් දැක්වෙන (බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් 1959 මැයි 11 සහ 24 වැනි දින සාදන ලද පිඹුරු අංක 396 හි සඳහන් ලොට් 10 හි නැවත මැනීමකි) ඉඩමට මායිම් වශයෙන් උතුරට : පිඹුරු අංක 396 හි ලොට් 5 ද, නැගෙනහිරට : පිඹුරු අංක 396 හි ලොට් 9 ද, දකුණට මංචනායකගේ කුඹුරුයාය ද සහ බස්නාහිරට : පිඹුරු අංක 396 හි ලොට් 9 ට මායිම වූ එකී අංක 354 දරන පිඹුරු ප්‍රකාරව පර්චස් විස්සක (අ. 0 රූ. 0 පර්. 20) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමඟ වේ.

මෙහි පහත උපලේඛනයේ විස්තර සඳහන් ඉඩම් කට්ටියට මතුපිටින් යෑම් ඊම් පිවිසීම පිටවීම ගැණුම්කරුගේ සේවකයින් කුලී නිවැසියන් අමුත්තන් සහ අනුමත පුද්ගලයින්ගේ නිදහස් ගමනාගමනය හරකා බාන අශ්වයින් හෝ වෙනත් සතුන් රැගෙන එහා මෙහා යෑම මෝටර් රථවලින් ලොරි රථවලින් භාණ්ඩ ඇති හෝ නැතිව එහා මෙහා යෑම ඉඩමට ඉහලින් හෝ පොළොව යටින් ජලය හෝ විදුලිය සඳහා බට දැමීම රැහැන් ඇදීම අපජලය සඳහා බට එලීම දුරකථන සඳහා රැහැන් ඇදීම හෝ දැනට ඉදිකොට ඇති එවැනි බට හෝ රැහැන් ආදියට සම්බන්ධතා සිදුකිරීම ආදියට ඇති නිදහස් සහ නිරවුල් අයිතිය සමඟ වේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ මහරගම නගර සභා සීමාවේ ගංගොඩවිල පිහිටි ලන්සියාදෙණිය හෙවත් පින්හේන්දෙණිය හෙවත් ලන්සිගේවත්ත බෙදා වෙන්කොට සාදන ලද ඉහත සඳහන් පිඹුරු අංක 396 හි ලොට් 5 වශයෙන් දැක්වෙන (අඩි 10ක් පලළ පාරක් සඳහා වෙන්කිරීමක්) ඉඩම් කට්ටියට මායිම් වශයෙන් උතුරට : ඉහත සඳහන් පිඹුරු අංක 396 හි ලොට් 4 සහ 6 ද, නැගෙනහිරට : එම පිඹුරු අංක 396 හි ලොට් 6 සහ 9 ද, දකුණට : එම 396 පිඹුරේ ලොට් 10 සහ 11 ද, සහ බස්නාහිරට : ලොට් 3 (දීපවැල්ල) සහ පිඹුරු අංක 396 හි ලොට් 4 ට මායිම් වූ එකී අංක 396 දරන පිඹුරු ප්‍රකාරව පර්චස් අටයි දශම පහයි බිංදුව (අ. 0, රූ. 0, පර්. 8.50) ක වන මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරු A3/17 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

05-09

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

***සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.***

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2014**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| මැයි | 2014.05.02 | සිකුරාදා | 2014.04.17 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2014.05.09 | සිකුරාදා | 2014.04.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.16 | සිකුරාදා | 2014.05.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.23 | සිකුරාදා | 2014.05.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.05.30 | සිකුරාදා | 2014.05.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2014.06.06 | සිකුරාදා | 2014.05.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.13 | සිකුරාදා | 2014.05.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.20 | සිකුරාදා | 2014.06.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.06.27 | සිකුරාදා | 2014.06.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2014.07.04 | සිකුරාදා | 2014.06.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.11 | සිකුරාදා | 2014.06.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.18 | සිකුරාදා | 2014.07.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2014.07.25 | සිකුරාදා | 2014.07.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.